# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල — மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் — Provincial Council Office Complex, Kurunegala

ආයතන හා පරිපාලන අංශය  தாபனமும் நிருவாக பிரிவு Establishment and Administration Division


මගේ අංකය / எனது இலக்கம் / My No: NWP/CS/AD/22/10/1/2023  
ඔබේ අංකය / உமது இலக்கம் / Your No:  
දිනය / திகதி / Date: 2023.05.02

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,  
සභා ලේකම් - වයඹ පළාත් සභාව,  
ලේකම් - වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,  
සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,  
සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුනි,  
සියළුම පළාත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්

**<u>චක්‍රලේඛ වයඹ පළාත් සභාවට අදාල කිරීම</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශකටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛය වයඹ පළාත් සභාවට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2023.04.27 දින ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක: NWP/GOV/AD11/1/1/17/1 හා 2023.04.28 දිනැති ලිපියෙන් මා වෙත දන්වා එවා ඇත.

02. මෙම චක්‍රලේඛය,www.pubad.gov.lk  වෙබ් අඩවියෙන් භාගත කර අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

| අනු අංකය | චක්‍රලේඛ අංකය සහ දිනය | විස්තරය |
|---|---|---|
| 01. | ස්වදේශ කටයුතු .ච.ලේ. අංක: 11/2023 හා 2023.04.11 | රාජ්‍ය වෙසක් මහෝත්සවය සැමරීම - ශ්‍රී බුද්ධ වර්ෂ 2567 |

අයි.කේ.එම්.එම්.එස්. ඉලංගසේකර  
සහකාර ප්‍රධාන ලේකම් I (පරිපාලන)

අ/කලේ: රංජිත් ආරියරත්න  
ප්‍රධාන ලේකම්  
වයඹ පළාත

D:\චක්‍රලේඛ\Circulars.all\2023\රාජ්‍ය පරිපාලන\ස්වදේශ කට ච.ලේ11.2023.docx


ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — Tel : 037-2223777, Fax : 037-2228019, e-mail : csnwp@sltnet.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) — Tel : 037-2223195, e-mail : depcsnwp@sltnet.lk

ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 11/2023

මගේ අංකය : එච්ඒඑෆ්/1/2-2022
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

2023.04. 11

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>රාජ්‍ය වෙසක් මහෝත්සවය සැමරීම - ශ්‍රී බුද්ධ වර්ෂ 2567</u>

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 ක් වූ 2023 වර්ෂයේ වෙසක් උත්සවය වෙනුවෙන් **2023 මැයි මස 02** වන දින සිට **මැයි මස 08** වන දින දක්වා සතියක කාලය රජය මගින් වෙසක් සතිය ලෙස ප්‍රකාශයට පත් කර ඇත. එසේම මෙයට අදාළ රාජ්‍ය උත්සවය 2023 මැයි මස 04 වන දින පුත්තලම් දිස්ත්‍රික්කයේ හලාවත මාදම්පේ කැබැල්ලෑවල ශ්‍රී රතනසිරි පිරිවෙන් විහාරස්ථානයේ දී අතිගෞරවනීය ස්වාමීන්වහන්සේලාගේ අනුශාසකත්වයෙන් හා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ද, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුලු අනෙකුත් මැතිඇමතිවරුන්ගේ සහ ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. එසේම මෙම වෙසක් සතිය පහත සඳහන් තේමා පාඨය යටතේ පැවැත්වීමට ද රජය තීරණය කර ඇත.

**"අවජ්ජේ වජ්ජමතිනො - වජ්ජේ චාවජ්ජදස්සිනො**
**මිච්ඡාදිට්ඨිසමාදානා - සත්තා ගච්ඡන්ති දුග්ගතිං"**

**එනම්**

"නිවැරදි දේ වැරදි ලෙසත්, වැරදි දේ නිවැරදි ලෙසත් දැකීම දුගතියට හේතු වේ" යන්නයි.

03. ඒ අනුව, 2023 මැයි මස 02 වන දින සිට 08 දින දක්වා වන කාලය තුළ රජයේ සියලුම ගොඩනැගිලිවල බෞද්ධ කොඩිය ඔසවා තැබීමට හා එම ගොඩනැගිලි පරිසර හිතකාමී වෙසක් සැරසිලිවලින් අලංකාර කිරීමට ද තීරණය කර ඇත.

04. එසේම මෙම කාලය තුළ සියලුම ආයතන ආශ්‍රිතව, විශේෂයෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන මට්ටමින් වෙසක් උත්සවය වෙනුවෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. ඒ සඳහා දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය සාසනාරක්ෂක බල මණ්ඩල වල උපදේශකත්වය ඇතිව ප්‍රාදේශීය වශයෙන් ආගමික ස්ථාන සහ ඒ වෙනුවෙන් උනන්දුවක් දක්වන වෙනත් ආයතන සහ පුද්ගලයින් සහභාගී කරගෙන සංවිධානය කරලීමට හැකිවනු ඇති අතර අදාළ කටයුතු වඩාත් පහසුවෙන් සිදු කර ගැනීම සඳහා අවශ්‍ය සියලුම පියවර ගන්නා ලෙස ද දන්වමි. තවදුරටත් වෙසක් සතිය වඩාත් අර්ථවත් කිරීම සඳහා ඒ ඒ තේමාවන් යටතේ ආයතන විසින් පහත සඳහන් පරිදි විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලබන ලෙසට ද වැඩිදුරටත් දන්වමි.

අ. පළමු දිනය : 2023 මැයි මස 02 වන අඟහරුවාදා

තේමාව : පරිසර සංරක්ෂණය

ක්‍රියාත්මක කල හැකි වැඩසටහන් :

i. පැළ රෝපණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම.
ii. ආගමික ස්ථාන ආසන්න පරිසරය / වෙරළ තීර පිරිසිදු කිරීම.
iii. කසළ කළමනාකරණය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
iv. ආගමික ස්ථාන පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන් සංවිධානය කිරීම.
v. බුදු දහම හා පරිසරය පිළිබඳව හා පරිසරය රැකගැනීම පිළිබඳව දේශන හා වැඩමුළු පැවැත්වීම.

ආ. දෙවන දිනය : 2023 මැයි මස 03 වන බදාදා

තේමාව : සෞඛ්‍ය සම්පන්න දිවියක්

ක්‍රියාත්මක කල හැකි වැඩසටහන් :

i. සෞඛ්‍යමත් දිවි පෙවෙතක් උදෙසා දේශීය ආහාර පරිභෝජනය පිළිබඳ වැඩමුළු සහ ප්‍රදර්ශන පැවැත්වීම.
ii. ආහාර සුරක්ෂිතතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
iii. වැඩිහිටි නිවාස සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම හා දිවා ආහාරය ලබාදීම.
iv. ලේ දන්දීමේ වැඩසටහන් පැවැත්වීම.
v. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් උදෙසා බුදු දහම ඇසුරින් දේශන පැවැත්වීම.
vi. නොමිලේ වෛද්‍ය සායන,අක්ෂි සායනය වැඩසටහන් පැවැත්වීම
vii. මත්ද්‍රව්‍ය නිවාරණ දුම්වැටි විරෝධී වැඩසටහන් සංවිධානය කිරීම.

ඇ. තෙවන දිනය : 2023 මැයි මස 04 වන බ්‍රහස්පතින්දා

තේමාව : සාරධර්ම ප්‍රවර්ධනය

ක්‍රියාත්මක කල හැකි වැඩසටහන් :

i. හෙළ බොදු සිරිත් විරිත්වල වටිනාකම පිළිබඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ හා උපදේශන වැඩසටහන් පැවැත්වීම
ii. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සහ දරුවන් අතර පවත්වන කථික හා චිත්‍ර තරඟ පැවැත්වීම
iii. සාරධර්ම පෙරහැර හා වැඩසටහන් පැවැත්වීම
iv. වැඩිහිටි නිවාස, ළමා නිවාස හා රෝහල් වැනි ස්ථානයන්හි ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම